සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
வடமேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Provincial Education - NWP

8 ශ්‍රේණිය | පළමු වාර පරීක්ෂණය - 2019 | 15 S

# ක්‍රිස්තියානි ධර්මය

නම .................................................. කාලය පැය දෙකයි

උපදෙස් : සියළුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න,
නිවැරදි පිළිතුරු යටින් ඉරක් අඳින්න.

- නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. දූවිල්ලෙන් නිර්මාණය වූ මනුෂ්‍යයා ජීවය ලැබුයේ,
(1) දෙවි සමිඳුන්ගේ වචනය තුළ ය. (2) දෙවි සමිඳුන්ගේ මහත් බලය තුළ ය.
(3) දෙවි සමිඳාණන් ජීවන හුස්ම හෙළීම තුළ ය. (4) හාස්කමක් ලෙස ය.

02. මනුෂ්‍යයා දේව මැවිල්ලේ,
(1) අයිතකරු ය (2) භාරකරු ය
(3) අයිතිකරු හා භාරකරු ය (4) නිර්මාණකරු ය

03. මෙලොව ඇති විශ්මිත නිර්මාණ අතර අසමසම නිර්මාණය වන්නේ,
(1) පරිගණකය ය. (2) සබ්මැරීනය (3) අහස්යානය ය (4) මිනිසා ය

04. ලෝකය නිර්මාණය කිරීමට අදාළ සිද්ධීන් ශුද්ධ වූ බයිබලයෙහි දක්වා ඇත්තේ,
(1) කවි කතා මගින් ය (2) සංකේත මගින් ය
(3) කවි මඟින් ය (4) කවි හා කතාන්දර මඟින් ය

05. ඊශ්‍රායෙල්වරුන් මිසරයේ වහලුන් ලෙස ගත කල කාලය වන්නේ,
(1) හාරසීයක් ය (2) හාරසිය තිහක් ය
(3) හාරසිය තිස්තුනක් ය (4) හාරසිය තිස්පහක් ය

06. ජීවිත ගමනේදී අත්විඳින්නට සිදු වන තවකාලික අපහසුතා අප,
(1) ප්‍රතික්ෂේප කළ යුතු ය (2) දරාගත යුතු ය
(3) මැසිවිලි නැගිය යුතු ය (4) පිළිගත යුතු ය

07. ශුද්ධ වූ බයිබලයේ ගීතාවලිය 23 වන පරච්ඡේදයේ සඳහන්ව ඇත්තේ,
(1) අබ ඇටයේ උපමාව ය (2) වපුරන්නාගේ උපමාව ය
(3) යහපත් බැටළු එඩේරා පිළබදව ය (4) කමා නොවූ දාසයා පිළිබඳව ය

08. දෙවියන් වහන්සේ අප එකිනෙකා
(1) හඳුනන්නේ නැත (2) වෙන් වෙන්ව හඳුනති
(3) හඳුනාගැනිමට කැමති ය (4) හඳුන්වා දිය යුතු ය

09. ජේසුස් වහන්සේ ලෙවී හමුවන්නේ,

(1) මුහුදු වෙරළේදී ය. (2) බදු පොළේදී ය.

(3) ලෙවීගේ නිවසේදී ය (4) දේව මාලිගාවේදී ය

10. දේව දරුවන් වන ඔබ තුළ තිබිය යුතු ගුණාංගයක් වන්නේ,

(1) ආඩම්බරකම ය (2) වංචාව ය

(3) නිහතමානීකම ය (4) අකීකරුකම ය

11. උත්ථානවූ ජේසුස් වහන්සේගේ ඇණ කැළැල් දැක ඇදහූ තැනැත්තා වන්නේ,

(1) පිලිප් ය (2) තෝමස් ය

(3) ඇල්පේවුස්ගේ පුත් ජාකොබ් ය (4) සෙබදිගේ පුත් ජාකොබ් ය

12. ජේසුස් වහන්සේ මෙන් අපත් පරික්ෂාවලින්,

(1) පරාජය විය යුතු ය. (2) ජය ගත යුතු ය.

(3) මැසිවිලි නැගිය යුතු ය (4) දුක්විය යුතු ය

13. කිතුණු අපගේ ජීවිතවල ගන්නා වැදගත් තීරණවලදී අප,

(1) විමසිලිමත් විය යුතු ය (2) හොඳින් කල්පනා කළ යුතු ය

(3) යහළුවන් සමග සාකච්ඡා කළ යුතු ය (4) යාච්ඤාවෙන් සවිමත් විය යුතු ය

14. ශ්‍රාවකත්වය සඳහා දේව කැඳවීම ලැබීමට,

(1) තරාතිරම් සලකා බලනු ලැබේ (2) සමාජ පසුබිම සලකා බලනු ලැබේ

(3) සමාජ තත්වය සලකා බලනු ලැබේ (4) ඉහත කිසිවක් සැලකිල්ලට ගනු නොලැබේ

15. ජේසුස් වහන්සේ පාවා දුන් ශ්‍රාවකයා වන්නේ

(1) පේදුරු ය (2) ජොහාන් ය (3) ජුදස් ඉස්කාරියොත් ය (4) තෝමස් ය

16. ධර්මදූත සේවාව මගින් ජේසුස් වහන්සේ ප්‍රේරිතයන්ගෙන් බලාපොරොත්තු වූයේ

(1) හාස්කම් කිරීම.

(2) දේව අනුග්‍රහය, මනුෂ්‍යයාගේ යහපත වෙනුවෙන් කැප කිරීම.

(3) උන්වහන්සේගේ බලවත් බව ප්‍රකාශ කිරීම.

(4) කීර්තියක් අත්පත් කර ගැනීම.

17. කිතුණු දරුවන් ලෙස අපට වැරදි කරන අයට අප,

(1) වෛර කළ යුතු ය (2) රණ්ඩුවට යා යුතු ය.

(3) ප්‍රතික්ෂේප කළ යුතු ය (4) සමාව දිය යුතු ය

● ප්‍රශ්ණ අංක 18 - 20 දක්වා ඇති ප්‍රශ්ණ වලට හිස්තැනට සුදුසු වචනය තෝරා යටින් ඉරක් අදින්න.

18. ''මිනිස් ජීවිතය සදාකාලික නොවුවත් මිනිසා කෙරෙහි .................................................................... සදාකාලිකව පවතී.

(1) දේව ප්‍රේමය (2) දේව බලය

(3) දේව වචනය (4) දේව ක්‍රියාව

19. ඉශ්‍රායෙල් සෙනගට කාන්තාර ගමනේදී දිවා කාලයේ මඟ පෙන්වූයේ ..................................................... ය.

(1) ගිනි ටැඹක් ය (2) වළා ටැඹක් ය

(3) ගිනි සහ වළා ටැඹක් ය (4) විශාල අලෝකයක් ය

20. ''දෙවියන් වහන්සේ මනුෂ්‍යයාව කෙතරම් ප්‍රේමකල සේක්ද කීවොත් ස්වකීය ........................................................ වුවද ලොවට දෙවා වදාළ සේක.

(1) ඒක ජාතක පුත්‍රයාණන් (2) පුත්‍රයාණන්

(3) ගැලවුම්කරුවාණන් (4) මිදුම්කරුවාණන්

## II - කොටස

ක්‍රිස්තියානි ධර්මය

- පළමුවන ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්ණ 05 කට පිළිතුරු සපයන්න.
- කෙටි පිළිතුරු ලියන්න.

01. (i) සර්පයාගෙන් සංකේතවත් වූයේ කුමක්ද?

(ii) පාපය නිසා මිනිසාට අහිමි වූයේ කුමක්ද?

(iii) මිනිසාට පාපය නිසා ලැබුණු දඩුවම් 02ක් ලියන්න.

(iv) දෙවියන් වහන්සේ විසින් තෝරාගනු ලැබූ විශේෂ ජාතිය කුමක්ද?

(v) ඉශ්‍රායෙල් සෙනගට බීමට නොහැකි තරම් ජලය හමුවූ ස්ථානය කුමක්ද?

(vi) ගෙනසරෙත් විල හැඳින්වූ වෙනත් නමක් ලියන්න.

(vii) ධර්මදූත සේවය යනු කුමක්ද?

(viii) ඔබ අයත් කිතුණු සභාව වෙනුවෙන් ඔබට කළ හැකි යහපත් ක්‍රියා 02ක් ලියන්න.

(ලකුණු 2 X 8 = 16)

02. (i) ඉශ්‍රායෙල් සෙනඟ තම ජීවිතයේ දුක්ඛිත තත්වයන් තුළදී කළ කාර්ය කුමක්ද? (ල. 02)

(ii) අද සමාජයේ මනුෂ්‍යයා විවිධාකාරවූ වහල් බැම්වල සිරවී සිටී. එම වහල් බැම් තුනක් ලියන්න. (ල. 03)

(iii) ඔබ අවට සමාජයේ සිටින යහළු යෙහෙලියන් අනවශ්‍ය ලෙස වහල්භාවයට පත්ව ඇති දේවල් තුළින් ඔවුන් මුදවා ඔවුන්ට විමුක්තිය ලබාදෙන ලෙස කරන යාච්ඤාවක් ලියන්න. (ල. 06)

03. (i) යහපත් බැටළු එඬේරා ලෙස හඳුන්වන්නේ කවුද?

(ii) යහපත් එඬේරා කරන කාර්යන් තුනක් ලියන්න.

(iii) ජේසුස් වහන්සේ නොහඳුනන අයට ජේසුස් වහන්සේ හඳුනා ගැනීමට පාසල තුළ ඔබ ක්‍රියා කරන්නේ කෙසේද? කරුණු 03 ක් ලියන්න.

04. (i) මනුෂ්‍යයා දෙවියන් වහන්සේ ප්‍රතික්ෂේප කරමින් තෝරාගත්තේ කුමක්ද?

(ii) ආදම් සහ ඒව පව්කළ අවස්ථාවේ දෙවියන් වහන්සේ පාපයට එරෙහිවූවද පව්කරුවා ප්‍රතික්ෂේප නොකරන බව සනාථ කරමින් කළ ක්‍රියාව කුමක්ද?

(iii) පාපයට යොමුවූ ඔබේ යහළුවෙකු වෙනුවෙන් ඔබට කල හැකි දේවල් තුනක් ලියන්න.

05. (i) ජුදෙව්වරුන් ඔවුන්ගේ ආගමික දේවමෙහෙයන් පැවැත්වූ ස්ථානය කුමක්ද?

(ii) ජේසුස් වහන්සේ නාසරෙන්හි ධර්මශාලාවේදී සිය මෙහෙවර අදාලව ඉදිරිපත් කළ විශේෂ කරුණු 03 ක් ලියන්න.

(iii) අද කිතුණු සභාව ජේසුස් වහන්සේගේ මෙහෙවර ඉටු කිරීම සඳහා කරන ක්‍රියාවන් තුනක් ලියන්න.

06. (i) ඉශ්‍රායෙන් සෙනගට නායකත්වය ලබාදීම සඳහා දෙවියන් වහන්සේ තෝරාගත් විශේෂිත පුද්ගලයා කවුද?

(ii) කාන්තාර ගමනේදී දෙවියන් වහන්සේ ඉශ්‍රායෙල් සෙනග පෝෂණය කළ ආකාර තුනක් ලියන්න.

(iii) දෙවියන් වහන්සේ ඔබේ ජීවිතයේ යාච්ඤා වලට පිළිතුරු දුන් අවස්තා 03 ක් ලියන්න.

08 - ශ්‍රේණිය

පළමුවාර පරීක්ෂණය - 2019

ක්‍රිස්තියානි ධර්මය

පිළිතුරු පත්‍රය

I - කොටස

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 01. (3) | 02. (2) | 03. (4) | 04. (2) | 05. (2) | 06. (2) | 07. (3) |
| 08. (2) | 09. (2) | 10. (3) | 11. (2) | 12. (2) | 13. (4) | 14. (4) |
| 15. (3) | 16. (2) | 17. (4) | 18. (1) | 19. (2) | 20. (1) | |

II - කොටස

01.

(i) නපුර

(ii) සදාකාල ජීවනය

(iii) පොළොව සමඟ ගැටෙමින් වෙහස මහන්සි වී වැඩ කිරීම

පුරුෂයා දහඩිය මහන්සියෙන් ආහාර උපයා ගැනීම.

ස්ත්‍රිය සැමියාගේ පාලනයට නතු වීම

දරුවන් ප්‍රසූත කිරීමේදී විළිරුදාව ඇතිවීම.

(iv) ඉශ්‍රායෙල් ජාතිය

(v) මාරා

(vi) ගලීලයේ මුහුද

(vii) ජේසුස් වහන්සේගේ සුභාරංචිය ජනතාව වෙත ගෙන යාම ධර්ම දූත සේවයවේ.

(viii) ලියා ඇති කරුණු අනුව ලකුණු ලබාදෙන්න.

(ලකුණු 2 X 8 = 16)

02.

(i) දෙවියන් වහන්සේට මොර ගැසීම/ යාච්ඤා කිරීම (ල. 02)

(ii) මිල මුදල්, ලෞකික සම්පත්, කීර්තිය, යසස්කාමය, සුරාව, සූදුව (ල. 03)

(iii) කරුණු 06ක් ඇතුළත්ව ලියා ඇත්නම් සම්පූර්ණ ලකුණු ලබා දෙන්න. (ල. 06)

03.

(i) ජේසුස් වහන්සේ (ල. 02)

(ii) දුබලවූවන් ඔසවාගෙන යයි

අයාලේ ගොස් ඇති බැටළුවන් රැගෙන එයි

තුවාල වූවන් සුවපත් කරයි.

වෘකයන්ගෙන් තම රැළට රැකවරණය ලබාදෙයි (ල. 03)

(iii) සිසුවා ලියා ඇති කරුණු සලකා බලා ලකුණු ලබා දෙන්න (ල. 06)

04.

(i) පාපය (ල. 02)

(ii) කොළ අතු වෙනුවට හම් වස්ත්‍ර සාදා ඇන්දවීම (ල. 03)

(iii) ලියා ඇති කරුණු සලකා බලා ලකුණු ලබා දෙන්න. (ල. 06)

●05.

(i) ධර්මශාලාව (ල. 02)

(ii) දිළිඳුන්ට සුභාරංචිය දේශනා කිරීම

වහලුන්ට මිදීම

අන්දයන් පෙනීම ලැබෙන බව

පීඩිතවූවන් මිදීම (ල. 03)

(iii) සුභාරංචිය ප්‍රකාශ කිරීම

දිළිඳුන්ට උපකාර කිරීම

ළමා/ වැඩිහිටි නිවාස මඟින් අසරණ වූවන්ට පිහිට වීම

විවිධ වැඩසටහන්, උපදේශන සේවා ආදි ලියා ඇති කරුණු සලකා බලා ලකුණු දෙන්න (ල. 06)

06.

(i) මොසෙස්

(ii) මන්නා සහ වටුවන් ලබාදීම

හොරෙබ් පර්වතයෙන් ජලය ලබා දීම

බීමට නොහැකි ජලය හමුවූ මාරා නම් ස්ථානයේ ජලය ලබාදීම (ල. 03)

(iii) ලියා ඇති කරුණු සලකා බලා ලකුණු ලබාදෙන්න (ල. 06)